# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,879/12 — 1969 නොවැම්බර් 26 වැනි බදද — 1969.11.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්ඩී—බී16/37
ඊසී—එල්සී/එච්/532

### සුරාබදු ආඥාපනත

**සුරාබදු නිවේදන අංක 578**

(52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 32 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ අතුරු විධානයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති, විජයානන්ද දහනායක, වන මම ඉහත කී වගන්තිය යටතේ මා විසින් පනවන ලදුව මෙහිවූ උපලේඛනයෙහි දක්වෙන ව්‍යවස්ථාව 69.12.1 වැනි දින සිට වලංගු වියයුතු යයි මේ නිවේදනයෙන් ප්‍රකාශ කරමි.

වී. දහනායක,
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1969 නොවැම්බර් මස 26 වන දින,
කොළඹ දීය.

#### උපලෙඛනය

ව්‍යවස්ථාව

1. (1) රා සිල්ලරට විකිණීම සම්බන්ධයෙන් තත්කාලයෙහි නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක පටහැනිව කුමක් සඳහන් වුවද, කොළඹ මහා නගරය තුළ පිහිටි සෑම රා තැබෑරුමක්ම පෙරවරු 7 සහ පස්වරු 7 දක්වා වූ කාලය තුළ විවෘතව තැබියයුතු අතර, සෙසු සියලු වේලාවලදී වසා තැබිය යුතුය.

2. (2) අරක්කු සිල්ලරට විකිණීම සම්බන්ධයෙන් තත්කාලයෙහි නිකුත්කරනු ලබන යම් බලපත්‍රයක පටහැනිව කුමක් සඳහන් වුවද, කොළඹ මහ නගරය තුළ පිහිටි සෑම අරක්කු තැබෑරුමක්ම පෙරවරු 8 සහ පස්වරු 7 දක්වා වූ කාලය තුළ විවෘතව තැබිය යුතු අතර, සෙසු සියලු වේලාවලදී වසා තැබිය යුතුය.

11–766

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 24/69 දරන ආනයන පාලන දැන්වීම

**1969 ප්‍රංශ/ලංකා ණය යටතේ නිකුත් කැරෙන වෙන්කිරීම් මත කරනු ලබන ආනයන**

**(මේ දැන්වීම ඉහත සඳහන් ණය යටතේ ආනයනයන් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමක් නොවේ.)**

ඉහත සඳහන් ණය යටතේ දෙනු ලබන වෙන් කිරීම් මත ආනයන බලපත්‍ර නිකුත් කිරීමට අදළ කාර්ය පරිපාටිය පහත දක්වෙයි :—

(i) ඉහත සඳහන් ණය යටතේ බඩු ආනයන කරන ආනයනකයනට " 1969 ප්‍රංශ/ලංකා ණය " යන ශීර්ෂය යටතේ පංගු වෙන්කිරීම් මෙ දෙපාර්තමේන්තුවෙන් හෝ කර්මාන්ත සහ ධීවර අමාත්‍යාංශයේ ව්‍යවස්ථා අංශයෙන්/සංස්ථා අංශයෙන් නිකුත් කරනු ලැබේ.

(ii) එවැනි පංගු වෙන්කිරීම් ලත් ආනයනකයන් ඔවුන්ගේ ප්‍රංශ සැපයුම්කරුවන් සමඟ ගනුදෙනු අරඹා, ගිවිසුම් සම්පූර්ණකර ගැනීමෙන් ඉක්බිති, මේ දෙපාර්තමේන්තුවේ පංගු වෙන්කිරීම් අංකය සඳහන් කර, ගිවිසුමේ පිටපත් තුනක් වහාම ප්‍රංශයේ, පැරිසියේ, බුල්වාද් හොස්මාන් 9 (ඊ), අංක 21 දරන තැන " ප්‍රංශ විදේශීය වාණිජ බැංකුව (Banque Francaise Du Commerce Exterieur B.F.C.E.) වෙත යවන ලෙස ප්‍රංශ සැපයුම්කරුවනට දැනුම් දිය යුතුය. ඉන් එක් පිටපතක් බී.එෆ්.සී.ඊ. (B.F.C.E.). බැංකුවේ ලිපිගොනුවල රඳවා ගෙන අනෙක " විදේශීය වෙළඳාම පිළිබඳ ප්‍රංශ රක්ෂණ සමාගම " (Campaigne Francaise d' Assurance Pour De Commerce Exterieur-" COFACE ") වෙත යවනවා ඇත.

(iii) සැපයුම්කරුවන්ගේ වත්කම සහ කාර්මික කීර්තිය පිළිබඳව " බී.එෆ්.සී.ඊ. " " B.F.C.E. " බැංකුව සෑහීමට පත්වූ විගසම එම බැංකුව විසින් " COFACE " නැමති ප්‍රංශ බලධරයන්ගේ අනුමතය ඉල්ලුම් කළ තන්හි, සාමාන්‍යයෙන් දෙනු ලබන රක්ෂණ ඇප එම ආයතනය විසින් දෙනු ලබනවා ඇත. මේ ඇප ලත් විට, මේ දෙපාර්තමේන්තුවේ පංගු වෙන්කිරීම් අංකයද ගිවිසුම හැඳින්වීමේ " B.F.C.E. " අංකයද සඳහන් කර ගිවිසුමේ පිටපතක්ද බහාලමින්, ගිවිසුම පිළිගත් බව " B.F.C.E." බැංකුව විසින් කොළඹ, ආනයන හා අපනයන පාලක තැනට දැනුම් දෙනු ලබනවා ඇත.

(iv) ඒ ඒ තැනට අදළ සැටියෙන් ආනයන හා අපනයන පාලක තැනගේ හෝ කර්මාන්ත සහ ධීවර අමාත්‍යාංශයේ වෙන්කිරීම් ලියුමේ අංකය ගිවිසුමෙහි සඳහන් විය යුතුය.

(v) ඉහළ (iii) ඡෙදයේ සඳහන් පරිදි, බී.එෆ්.සී.ඊ. " B.F.C.E. " බැංකුවේ නිවේදනය ලැබුණු තන්හි ආනයන බලපත්‍ර නිකුත් කිරීමට මේ දෙපාර්තමේන්තුව ක්‍රියා කරනවා ඇත.

(vi) බලපත්‍ර ලැබුණු වහාම, ආනයනකයන් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහා බැංකුව විසින් සියලු බැංකු වෙත නිකුත්කර ඇති උපදෙස් අනුව, ආනයනයන් සඳහා ගෙවීම් පිළිබඳ කටයුතු ඇරැඹීමට සිය බැංකුව සමග විධිවිධාන යොදගත යුතුය.

(vii) හැම ගිවිසුමක් ම වටිනාකමින් ප්‍රංශ ප්‍රෑන්ක් එක් ලක්ෂයකට නොඅඩු විය යුතුය.

(viii) මේ ණය යටතේ මුදල් සැපයෙන ආනයනයනට අදළ සෑම ගිවිසුමකම, ප්‍රංශ නීතියේ ව්‍යවහාරය නියම කරමින්, ස්විට්සර්ලන්තයේ සූරිච්හි පිහිටි " ඉංටර්නැෂනල් චේම්බර් ඔෆ් කොමර්ස් (" International Chamber of Commerce ") ආයතනයේ ව්‍යවස්ථා සඳහන් කරනු ලබන්නා වූ අනිවාර්ය බේරුම් කිරීමේ වගන්තියක් ද අන්තර්ගත විය යුතුය.

(II) ඡෙදයෙහි සඳහන් ගිවිසුම්—එනම් ආනයනකයනුත් ප්‍රංශ සැපැයුම් කරුවනුත් අතර අත්සන් තැබිය යුතු ගිවිසුම් හෙවත් කොන්තරාත්තු පහත දැක්වෙන ආකෘතිය ප්‍රකාර සකස් විය යුතුය.

වී. ජේ. එච්. ගුණසේකර,
ආනයන හා අපනයන පාලක.

1969 නොවැම්බර් මස 25 දින,
කොළඹ 1.

**ගිවිසුම**

මින් මතු එක් පාර්ශවයකින් ආනයනකයා යනුවෙන් හඳුන්වන ලබන්නා වූ ..............................................ද අනෙක් පාර්ශ්වයෙන් විකුණුම්කරු වශයෙන් හඳුන්වනු ලබන්නා වූ..........................................................................
........................................අතර පහත දැක්වෙන් අයුරින් ගිවිස ගන්නා ලදී.

1. **භාණ්ඩවල ස්වභාවය සහ මිල :**

(1) පහත දැක්වෙන ද්‍රව්‍ය සැපැයීමට විකුණුම්කරු ද ඒවා මිළයට ගැනීමට ආනයනකයා ද මෙයින් බැඳෙත් :
(සැපැයෙන බඩුවල විස්තර සහ ප්‍රමාණය)

(2) මිල, රක්ෂණ සහ ප්‍රවාහණ ගාස්තු*/මිල සහ ප්‍රවාහණ ගාස්තු*පදනමක් මත විකුණුම්කරුට ගෙවිය යුතු වන, ඉහත සඳහන් ද්‍රව්‍යවල මුළු මිළ ගණන මෙසේය :

ප්‍රංශ fප්‍රෑන්ක්.............................................

**(I) අකුරු වගන්තිය—ආනයන වෙන් කිරීම :**

අංක :...................................................දරන ආනයන වෙන් කිරීම ලංකාවේ බලධරයන්ගෙන් ලබාගෙන ඇති බවට ගැනුම්කරුවෝ ප්‍රකාශ කර සිටිති.

**(II) ගෙවීම :**

1969 නොවැම්බර් 6 දින ලංකාණ්ඩුවත්, "ප්‍රංශ විදේශීය වාණිජ බැංකුවත්" (Banque Francaise du Commerce Exterieur) අතර අත්සන් තබන ලද " 1969 ප්‍රංශ/ලංකා ණය යටතේ නියමිත ගිවිසුම් හෙවත් කොන්තරාත්තු පිළිගැනීමට සහ මුදල් සැපැයීමට අදළ කාර්ය පරිපාටියෙහි " නිර්දිෂ්ට කොන්දේසි අනුව, ඉහත සඳහන් මිළ ගණන ගෙවිය යුතු වන අතර, තමන් කෙරේ බලපවත්වන්නා වූ එම කොන්දේසි අදළ පාර්ශවයන් විසින් දැන සිටිය යුතු ද වෙයි.

**(III) කොටස් වශයෙන් නැව්ගත කිරීම් :**

" 1969 ප්‍රංශ/ලංකා ණය යටතේ නියමිත ගිවිසුම් හෙවත් කොන්තරාත්තු පිළිගැනීමට සහ මුදල් සැපැයීමට අදළ කාර්ය පරිපාටියෙන් " අපේක්ෂිත පරිදි, ඉහළ 1 ඡෙදයෙහි සඳහන් බඩු සැපැයීම නැව්ගත කිරීම්...............................................................මගින් ක්‍රියාත්මක විය යුතු බව මෙයින් නියම කොට දක්වනු ලැබේ. එහෙයින්, ඔවුන්ගේ බාරයේ තබාගැනීම පිණිස, " ප්‍රංශ විදේශීය වාණිජ බැංකුව " (Banque Francaise du Commerce Extereur) වෙත මුල් මුදලට සරිලන පොරොන්දු නෝට්ටු කට්ටල.................................ක් ද පොළියට සරිලන පොරොන්දු නෝට්ටු කට්ටල.................................................ක් ද යැවීමට ආනයනකයා විසින් අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය.†

**(IV) ලියැවිලි**

" 1969 ප්‍රංශ/ලංකා ණය යටතේ නියමිත ගිවිසුම් හෙවත් කොන්තරාත්තු පිළිගැනීමට සහ මුදල් සැපැයීමට අදළ කාර්ය පරිපාටිය " අනුව, පහත සඳහන් ලියැවිලි ඉදිරිපත් කරනු ලැබූ තන්හි, එක් එක් නැව් බඩු තොගයේ(මිල රක්ෂණ සහ ප්‍රවාහණ ගාස්තු ඇතුළු*/මිල සහ ප්‍රවාහණ ගාස්තු ඇතුළු)* වටිනාකමෙන් 95% ක් සඳහා පොරොන්දු නෝට්ටුත් අදළ පොළියට සරිලන පොරොන්දු නෝට්ටුත් බාර දෙන ලෙස " ප්‍රංශ විදේශීය වාණිජ බැංකුව " (Banque Francaise due Commerce Exterieur) " වෙත වෙනස් කළ නොහැකි උපදෙස් නිකුත් කරන මෙන් ආනයනකයා විසින් ස්වකීය (ලංකාවේ) බැංකුවෙන් ඉල්ලා සිටිය යුතුය :—

—එක් එක් නැව් බඩු තොගයේ (මි.ර.ප්‍ර./මි.ප්‍ර.*ඇතුළු) වටිනාකමෙන් 100%ක් සඳහා ස්ථාපිත ඉන්වොයිස (පිටපත්..................යුතුව)

—නැව්ගත කරන්නාගේ ඇණවුම් පිට සම්පාදිත කොන්දේසි විරහිත, විශේෂ උපදෙස් ආදියක් නොයොද හිස්ව තබමින් අත්සන් යෙදූ, නෞභාර පත්‍ර.............................

—බඩු පිළිගත හැකි බවට විකුණුම්කරුගේ කර්මාන්ත ශාලාවේ දී නිකුත් කැරුණු සහතිකය (එබඳු සහතිකයක් අනවශ්‍ය නම් ඒ බව මෙහි සඳහන් කලයුතුය.)

—ආනයනකයාත් විකුණුම්කරුත් අතර ගිවිස ගත් පරිදි වෙනත් ලියැවිලි (විස්තර මෙහි දැක්විය යුතුය.)

**(V) බඩු බාරදීමේ කාලය :**

අනපේක්ෂිත හේතු උද්ගත වන තන්හි හැර සෙසු සියලු තන්හි, පහත දැක්වෙන ද " ප්‍රංශ විදේශීය වාණිජ බැංකුව " (Banque Francaise du Commerce Exterieur) වෙත ලැබී මාස..................ක් ඉකුත් වන්නට මත්තෙන් ඉහළ 1 ඡෙදයෙහි නියම කොට දක්වා ඇති බඩු නැව්ගත කළ යුතුය.

—සියයට පහක (5%) අත්පිට ගෙවීමක්.

—ආනයනකයාගේ බැංකුවෙන් නිකුත් කැරුණු වෙනස් කළ නොහැකි උපදෙසේ ඇතුළත් ලියමන.

—ඉහළ III ඡෙදයෙන් නියමකොට දක්වා ඇති පරිදි, මුල් මුදලට සරිලන පොරොන්දු නෝට්ටු කට්ටල සහ පොළියට සරිලන පොරොන්දු නෝට්ටු කට්ටල........................

* නොගැලපෙන්න කපාහළ මැනවි.

† පොරොන්දු නෝට්ටු කට්ටල ගණන අපේක්ෂිත නැව්ගත කිරීම් ගණනට සමානවිය යුතුය. එකම මාසයක් තුළ නැව්ගත කිරීම් කිහිපයක් වෙයි නම්, මෙහි පරමාර්ථයන් සඳහා, ඒ එකම නැව්ගත කිරීමක් පමණක්—එනම් මාසයේ පළමුවැනි නැව්ගත කිරීම වශයෙන් සලකනු ලැබේ.

(VI) ගිවිසුම වලංගු වීම :

—ප්‍රංශ බලධරයන්ගේ (" COFACE සහ " BFCE " ආයතනවල)

—කොළඹ, ආනයන හා අපනයන පාලක තැනගේ අනුමතය ලැබීමෙන් පසුව මේ ගිවිසුම වලංගු වන්නේය.

(VII) කාර්මික සහතික :

(කිසිවක් වෙතොත්)

(VIII) බේරුම් කිරීමේ වගන්තිය :

ගැනුම්කරුත් විකුණුම්කරුත් අතර ආරාවුල් කිසිවක් පැන නැගුණහොත් " ඉංටර්නැෂනල් චෙම්බර් ඔෆ් කොමර්ස් " ආයතනයේ සමාදනා කිරීමේ සහ බේරුම් කිරීමේ නීතිරීති අනුව පත් කරනු ලබන බේරුම්කරුවන් එකකු හෝ දෙදෙනෙකු විසින් යථෝක්ත නීතිරීති යටතේ එම ආරාවුල් බේරුම් කරනු ලැබේ. මෙහිලා ප්‍රංශ නීතිය අදළ වේ.

196 , .............................................................දින

...................................................................දී මුල්

පිටපත් පහකින් යුතුව සකස් කරන ලදී.

............................................. ...................................

ආනයනකයා. විකුණුම්කරු.

11–764

## අංක 25/69 දරන ආනයන පාලන දැන්වීම

(අංක 14/65 දරන ආනයන පාලන දැන්වීම සංශෝධනය)

අයිතිය ප්‍රකාශිත පශු ඖෂධ ආනයනය

අංක 14,461 සහ 1965.7.24 දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වුණු අංක 14/65 දරන ආනයන පාලන දැන්වීමෙහි සඳහන් අමෙරිකා එක්සත් ජනපදයේ, විට්මෝයර් ලැබෝරටරීස් නිෂ්පාදක සමාගම යටතේ දක්වුණු " ඒ–වී25 " විෂයය කපා—හැරීමෙන් යථෝක්ත ආනයන පාලන දැන්වීම සංශෝධනය කැරෙන බව ආනයනකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

වී. ජේ. එච්. ගුණසේකර,
ආනයන හා අපනයන පාලක.

1969 නොවැම්බර් 26
කොළඹ 1.

11–765